# සංස්ථාපිත තොරතුරු

**ආයතනයේ නම ලිපිනය :**

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100/ 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

**ලියාපදිංචිය :**

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

**භාරකාර මණ්ඩලය :**

- ගීතා කුමාරි විමලවීර මෙය - සභාපතිනි,(අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)
- නිමල් අබේසිරි මයා - පාලන භාරකාර
- ඩබ්.ඒ.ඩී.ආර්. ගුණවර්ධන මයා - සාමාජික
- කේ.ජී. සෝමසුන්දර මයා - සාමාජික
- කේ.ජේ.බී.ඒ. දිසානායක මයා - සාමාජික

**විගණන කමිටුව :**

- ටී.එන්. ඔෂන් මහතා - සභාපති, (අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව)
- ඩබ්.ඒ.ඩී.ආර්. ගුණවර්ධන මයා - සාමාජික
- කේ.ජී. සෝමසුන්දර මයා - සාමාජික
- කේ.ජේ.බී.ඒ. දිසානායක මයා - සාමාජික

**විගණක** : පෝජ් සහ සමාගම
වරලත් ගණකාධිකාරී,
141/7, වොක්ෂල් වීදිය,
කොළඹ 02.

**සේවාවන් ලබා ගන්නා බැංකුව:** මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

# සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ නිත්‍යවාසික අරමුදලක් වශයෙන් 1951 අංක 38 දරණ භාරකාර මණ්ඩල පනත (1956 සංශෝධිත) මගින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 2014 ගිණුම් වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා පළාත් පාලන ආයතන වල සේවයේ නිරතවූවන්ට සහනශීලී පොලී අනුපාත යටතේ පහසු කොන්දේසි මත කෙටිකාලීනව හා කඩිනමින් ණය මුදල් ලබාදීම තුලින් ඔවුන් ණය බරින් මුදවා ගැනීමේ ආයතනික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තව දුරටත් කැප වී සිටින බව සතුටින් දන්වමි.

සමාලෝචනයට ලක් කෙරෙන වර්ෂය තුල රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වල සේවකයන් 5,122 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් ලෙස පත්ව ඇති අතර පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රතිලාභින් 2.33% කින් වැඩි වී ඇත. එම ප්‍රතිලාභීන්ගෙන් 50% කට අධික පිරිසක් ආරක්ෂක අංශ සාමාජිකයින් වීම විශේෂත්වයකි. එසේම , 2014 වසරේ අගෝස්තු මස සිට ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන උපරිම ණය මුදල රු:50,000 දක්වා ඉහල නංවන ලදී. මෙම වර්ෂය තුළ ප්‍රතිලාභීන් 5,122 ක් සඳහා රුපියල් මිලියන 203.5 ක ණය මුදල් ලබාදීමට හැකිවීම ආයතනය ලද ජයග්‍රහණයකි. ණය අයකර ගැනීමේ ප්‍රගතිය 2013 වර්ෂයට සාපේක්ෂව 5.38% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

අක්‍රීය ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරමින් ගත් උත්සාහය 2014 වර්ෂය තුළ සාර්ථකව නිම කිරීමට හැකි විය.

අරමුදලේ මෙහෙයුම් හා මූල්‍ය තිරසරභාවය ආරක්ෂා කර ගැනීම සඳහා භාරකාර මණ්ඩලය විසින් නිරන්තර අවධානය යොමු කරන ලද අතර ආයතනයේ සුභසිද්ධිය උදෙසා ගත් පියවර අතර අරමුදලේ කාර්ය මණ්ඩලය දිරි ගැන්වීමේ අරමුණෙන් ණය සැපයීම , ප්‍රසාද දීමනා ලබාදීම හා ගොඩනැගිලි පරිශ්‍රය වැඩිදියුණු කිරීම හා කාර්යාල නවීකරණය , සේවක පුහුණුකිරීම් හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිණ. එසේම , 2015 වර්ෂයේදී තව දුරටත් ණය අරමුදල ශක්තිමත් කිරීමට හා ප්‍රතිලාභින් වෙත නිකුත් කරන උපරිම ණය සීමාව , රජයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා රු:250,000 ක් හා අනෙකුත් නිලධාරීන් සඳහා රු:100,000 ක් ලෙසට ණය ප්‍රමාණය වැඩි කර ඇත.

2014 වසර තුළ ආයතනයේ අභිමතාර්ථයන් හා අරමුණු ඉටුකරගැනීමෙහි ලා දක්වන ලද කැපවීම වෙනුවෙන් අරමුදලේ සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමන අතර රාජ්‍ය අංශයේ සේවකයින් ණය බරින් මුදවා සතුටුදායක රාජ්‍ය සේවයක් නගා සිටුවීමට දායකවීමේ ආයතනික මෙහෙවර ශක්තිමත් ලෙස අනාගතයේදී ද ලෝහෝර් ආර්යා ණය අරමුදල විසින් ඉටුකරනු ඇත.

සභාපතිතුමා
ලෝහෝර් ආර්යා ණය අරමුදල

# පාලන භාරකාරතුමාගේ සමාලෝචනය

ලෝහෝර් ආර්යා ණය අරමුදල රාජ්‍ය අංශයේ මෙන්ම අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ යහපත උදෙසා ඔවුන්ගේ කඩිනම් ණය අවශ්‍යතා සපුරාලමින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

2015 පෙබරවාරි මස මා අරමුදලේ පාලන භාරකාර ධූරයට පත්වීමෙන් පසුව 2014 මුදල් වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම ගැන ස්තුතිවන්ත වෙමි.

2014 වර්ෂයේ මෙම අරමුදලේ කාර්යභාරය සලකා බලන විට ප්‍රතිලාභීන් 5,122 දෙනෙකුට රුපියල් මිලියන 203 ක ප්‍රමාණයක් කෙටිකාලීන ණය නිකුත් කිරීමට හැකි වී ඇත. මෙය 2013 වර්ෂයේ කාර්ය සාධනය සමග සසඳා බලන විට 2014 වර්ෂයේ සතුටුදායක ප්‍රගතියක් පෙන්වයි. දශක ගණනාවක පැවති අක්‍රීය ණය අයකර ගැනීම සඳහා භාරකාර මණ්ඩලයේ විශේෂ අවධානය 2014 වර්ෂයේදී ද යොමුකර 95% ක ප්‍රමාණයක් සාර්ථකව අයකර ගැනීමට කටයුතු කරන ලදී. ණය නිකුත් කිරීමේ ලිපිලේඛන ක්‍රියාවලිය නවීකරණය කරමින් අක්‍රීය වන ණය ලිපිගොනු කඩිනමින් හඳුනා ගැනීමට පහසු වන අයුරින් ලේඛනාගාරය නවීකරණය කරමින් අනාගතයේදී කිසිම ණය ගිණුමක් අක්‍රීය නොවන ආකාරයෙන් පවත්වා ගෙන යාමට නව ක්‍රම වේදයක් හඳුන්වා දෙන ලදී.

තවද රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව පැවැත්වූ දැයට කිරුළ සංවර්ධන වැඩ සටහනට සමගාමීව යමින් මෙම අරමුදලේ ප්‍රතිලාභ රටේ සියලුම දිස්ත්‍රික්ක වල දුෂ්කර පලාත් වල සේවයේ නියුතු රාජ්‍ය සේවකයන්ට ද ලබා ගත හැකි වන අයුරින් අරමුදලේ පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරන ලදී.

ඉහත අරමුණු සපුරා ගැනීමේදී මේ සඳහා ඍජු දායකත්වය දැක්වූ පසුගිය භාරකාර මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ටත් මේ සඳහා ඇප කැප වූ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් 2015 පෙබරවාරි මස මා පාලන භාරකාර ධූරය භාර ගැනීමෙන් පසු මට දායකත්වය දක්වන සියුලු දෙනාටත් මාගේ ස්තුතිය ප්‍රකාශ කරමි.



පාලන භාරකාර.
ලෝහෝර් ආර්යා ණය අරමුදල

# ලෝහෝර් ආර්යා ණය අරමුදල

## දැක්ම

රාජ්‍ය අංශයේ සේවකයින්ට මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබන
ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියා කිරීම

## මෙහෙවර

රාජ්‍ය අංශයේ සේවකයින් ණය බරින්
මුදවා සතුටුදායක
රාජ්‍ය සේවයක් නගාසිටුවීමට දායක වීම

## අරමුණ

රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා පළාත් පාලන ආයතන වල
සේවයේ නිරත සේවකයින්ට සහනශීලී පොලී ප්‍රතිශතයක්
යටතේ පහසු කොන්දේසි මත කෙටිකාලීන ණය මුදල් කඩිනමින්
ලබා දීම මගින් ඔවුන් ණය බරින් මුදවා ගැනීම

## කාර්යභාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් ප්‍රතිලාභීන් සඳහා ණය ලබා දීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරිම.
- ණය කළමණාකරනය සඳහා යෝග්‍යවන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් වැඩි දියුණු කිරීම.
- අනෙකුත් රාජ්‍ය ආයතන වල සේවකයින්ට ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පහසුකාරකයකු වශයෙන් කටයුතු කිරීම.

# 1. 2014 වසරේ අරමුදලෙහි කාර්යසාධනය

## 1.1 2014 වසරේ ප්‍රතිලාභීන්

2014 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 5,122 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එය 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදි ප්‍රතිලාභින් 2.33% ක වර්ධනයකි. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව පළමුවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර 2014 වර්ෂයේ පවත්වන ලද දැයට කිරුළ වැඩසටහනට සමගාමීව අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ වැඩසටහන්වල දායකත්වයද මේ සඳහා උපයෝගි වී ඇත.එසේම ප්‍රතිලාභීන්ගෙන් 50% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව දෙවන වගුවෙන් නිරූපනය වේ.

**වගුව 01 – 2013 / 2014 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව**

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2014** | **(%)** | **2013** | **(%)** |
| කොළඹ | 763 | 14.90 | 711 | 14.20 |
| ගම්පහ | 680 | 13.28 | 677 | 13.52 |
| අනුරාධපුරය | 341 | 6.66 | 322 | 6.43 |
| මහනුවර | 338 | 6.60 | 303 | 6.05 |
| වව්නියාව | 22 | 0.43 | 25 | 0.50 |
| කළුතර | 444 | 8.66 | 416 | 8.32 |
| රත්නපුර | 186 | 3.63 | 172 | 3.43 |
| ගාල්ල | 268 | 5.23 | 287 | 5.73 |
| කුරුණෑගල | 515 | 10.05 | 428 | 8.55 |
| පුත්තලම | 101 | 1.96 | 53 | 1.06 |
| යාපනය | 05 | 0.10 | 02 | 0.04 |
| පොළොන්නරුව | 131 | 2.56 | 271 | 5.42 |
| ත්‍රිකුණාමලය | 27 | 0.53 | 211 | 4.22 |
| මුලතිව් | 07 | 0.14 | 04 | 0.08 |
| මන්නාරම | 10 | 0.20 | 08 | 0.16 |
| බදුල්ල | 172 | 3.36 | 145 | 2.90 |
| මාතලේ | 133 | 2.60 | 123 | 2.45 |
| හම්බන්තොට | 138 | 2.69 | 90 | 1.80 |
| කෑගල්ල | 335 | 6.54 | 191 | 3.82 |
| මඩකලපුව | 02 | 0.04 | 41 | 0.82 |
| අම්පාර | 97 | 1.89 | 228 | 4.55 |
| මොනරාගල | 174 | 3.40 | 122 | 2.44 |
| නුවරඑළිය | 79 | 1.54 | 66 | 1.33 |
| මාතර | 154 | 3.01 | 109 | 2.18 |
| **එකතුව** | **5122** | | **5,005** | |

වගුව 02 - 2013 හා 2014 වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

| තනතුර | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | **2014** | **2013** |
| හමුදා සෙබල | 995 | 983 |
| පොලිස් කොස්තාපල් | 622 | 590 |
| පොලිස් සැරයන් | 234 | 216 |
| සාමාන්‍ය කම්කරු | 381 | 514 |
| කාර්යාල කාර්යය සහායක | 249 | 330 |
| කළමනාකරණ සහකාර | 185 | 375 |
| කෝප්‍රල් | 1,632 | 1,207 |
| රියදුරු | 122 | 145 |
| පොලිස් පරීක්ෂක | 59 | 46 |
| උප පොලිස් පරීක්ෂක | 36 | 31 |
| අරක්කැමි | 27 | 57 |
| පොලිස් ආරක්ෂක සහායක | 35 | 11 |
| මැනුම් සහායක | 55 | 28 |
| බන්ධනාගාර නියාමක | 59 | 46 |
| භෝජනාගාර සේවක | 24 | 24 |
| සංවර්ධන සහකාර | 44 | 38 |
| උපස්ථායක | 07 | 04 |
| මුරකරු | 26 | 18 |
| මෝටර් කාර්මික | 05 | 02 |
| පොලිස් සිවිල් සහායක | 07 | 02 |
| කාර්මික ශිල්පි | 27 | 15 |
| වඩු කාර්මික නිලධාරී | 14 | 07 |
| සෞඛ්‍ය පරිපාලක | 20 | 05 |
| මේජර් | 29 | 18 |
| මානව සම්පත් සහකාර | 13 | 04 |
| ගිනිභටයන් | 17 | 02 |
| පරිපාලන නිලධාරී | 06 | 11 |
| පෙදරේරු | 10 | 09 |
| ගණකාධිකාරී | 01 | 09 |
| ලුතිනන් | 45 | 60 |
| ගබඩා සහායක | 06 | 07 |
| විදුලි කාර්මික | 15 | 07 |
| බයිසිකල් පනිවිඩකරු | 04 | 02 |
| ඕවර්සියර් | 06 | 02 |
| තැපැල් නිලධාරී | 20 | 13 |
| සහකාර අධ්‍යක්ෂක | 04 | 05 |
| පිළිගැනීමේ නිලධාරී | 04 | 02 |
| පොත් බැඳුම්කරු | 08 | 02 |
| ග්‍රාම නිලධාරී | 04 | 29 |
| වැඩසටහන් සහකාර | 13 | 31 |
| වෙනත් | 52 | 98 |
| **එකතුව** | **5,122** | **5,005** |

## 1.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රජය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම ආයතනයෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- විශ්‍රාම වැටුප් රහිත අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් අයකර අවසන් කර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම.( විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 55 ලෙස සලකනු ලැබේ)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

ඉහත සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිළිබඳව 2014 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

**වගුව - 03 - ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය - 2014**

| මාසය | නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව | සුදුසුකම්ලත් ණයලාභීන් සංඛ්‍යාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය වටිනාකම (රු. 000) |
|---|---|---|---|---|
| ජනවාරි | 750 | 416 | 412 | 16,275 |
| පෙබරවාරි | 760 | 425 | 428 | 16,890 |
| මාර්තු | 1,043 | 460 | 437 | 17,110 |
| අප්‍රේල් | 578 | 412 | 410 | 16,005 |
| මැයි | 1,216 | 437 | 438 | 17,135 |
| ජූනි | 924 | 459 | 452 | 17,735 |
| ජූලි | 915 | 496 | 493 | 19,260 |
| අගෝස්තු | 700 | 490 | 483 | 18,770 |
| සැප්තැම්බර් | 817 | 437 | 422 | 16,525 |
| ඔක්තෝබර් | 729 | 407 | 319 | 12,545 |
| නොවැම්බර් | 704 | 361 | 375 | 14,745 |
| දෙසැම්බර් | 876 | 428 | 453 | 20,510 |
| **එකතුව** | **10,012** | **5,228** | **5,122** | **203,505** |

### 1.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2014 වසරේ අගෝස්තු මාසයේ සිට ප්‍රදානය කරනු ලබන උපරිම ණය මුදල රු.50,000/- දක්වා වැඩි කරන ලදී. රු. 10,000/- ක් වන ඉතාම සුළු ණය මුදල ද හදිසි අවශ්‍යතාවයකදී සුළු සේවකයින් හට ලබා ගැනීමට හැකි වන අයුරින් 2014 වසරේදීද පවත්වාගෙන යාමට ක්‍රියා කරන ලදී.

ඒ අනුව ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල උපරිම ණය සීමාවන්ට යටත්ව ලබා දුන් මුළු ණය වටිනාකම පහත පරිදි වේ. මෙහිදී රාජ්‍ය සේවකයින් 5,122 දෙනෙකුට රුපියල් මිලියන 203.5 ක ණය මුදලක් ලබා දී ඇත. 2013 වසරේදී නිකුත් කල මුළු ණය මුදල් ප්‍රමාණය වන රු.මි. 194.4 ට සාපේක්ෂව 4.9% වර්ධනයක් පෙන්වයි.

**වගුව 04 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය**

| උපරිම ණය සීමාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම (රු. මිලියන) |
|---|---|---|
| 50,000<br>40,000 | 274<br>4,577 | 13,700<br>183,080 |
| 30,000 | 151 | 4,530 |
| 20,000 | 87 | 1,740 |
| 15,000 | 25 | 375 |
| 10,000 | 8 | 80 |
| එකතුව | **5,122** | **203,505** |

### 1.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය

2011 හා 2014 වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 5 වන වගුවෙන් හා 1 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වසරේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය 5.38 % ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**වගුව 05 – 2011 සිට 2014 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම**

| වර්ෂය | ණය සංඛ්‍යාව | ණය නිකුත් කිරීම (රු. 000) | ණය අයකර ගැනීම (රු. 000) |
|---|---|---|---|
| 2011 | 4791 | 193,645 | 215,221 |
| 2012 | 4358 | 173,970 | 228,064 |
| 2013 | 5005 | 194,040 | 240,064 |
| 2014 | 5122 | 203,505 | 252,973 |

**ප්‍රස්තාරය - 01**



## 1.5 වර්ෂ ගනනාවක් පැවැති අක්‍රීය ණය අයකර ගැනීමේ ප්‍රගතිය

2011.04.29 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදි ලෝහෝර් ආර්යා ණය අරමුදලේ පවත්නා අඩුපාඩු හා දුර්වලතා සම්බන්ධයෙන් සාකාච්ඡාවට ලක් කල අතර එහි ප්‍රගතිය විමර්ශණයට භාජනය විය. 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ අවසාන ගිණුම් හා විගණන වාර්තාව 2013.03.06 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සමාලෝචනයට ලක් කරන ලදී.

එහිදී විශේෂ අවධානය යොමු කරන ලද අක්‍රීය ණය සම්පූර්ණයෙන් අයකර ගැනීමටත්, තව දුරටත් අයකර ගත නොහැකි එහෙත් හේතු සහිතව ඔප්පු කල හැකි අක්‍රීය ණය සම්පූර්ණයන් පොත් වලින් ඉවත් කිරීමටත් සහ ආයතනයට අතිරික්ත මුදල් අයවීම පාලනය කිරීමටත් 2014 වසර පුරාම පහත පරිදි කටයුතු කර ඇත.

01. ඉදිරිපත් කර තිබූ වාර්තා මත ඒ ඒ වකවානු වල අක්‍රීය ණය බවට පත් වූ රුපියල් මිලියන 09 ක මුදල (Capital Loan Amount) විමර්ශණයට භාජනය වන අවස්ථාව වන විට (පොලිය ද සමග) රුපියල් මිලියන 59.2 ක් දක්වා එකතුවීම හා එයින් රුපියල් මිලියන 51.5 ක්ම වසර 10 කට වඩා කල්පසු වූ ක්‍රියාකාරී නොවන ණය බවට පත්ව තිබීම මෙම කමිටුවේ ප්‍රධාන නිරීක්ෂණය විය. මෙම ක්‍රියාකාරී නොවන ණය 1984 වර්ෂයේ සිට පවත්වා ගෙන එන බව ද නිරීක්ෂණය කරන ලදී. (වගුව 6).

02. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදෙස් පිළිබඳව භාරකාර මණ්ඩලය තව දුරටත් අවධානය යොමු කරමින් ක්‍රියාකාරි නොවන ණය ආපසු අය කර ගැනීම සඳහා වෙනම නිළධාරීන් පත් කර මෙම අක්‍රීය ණය අය කර ගැනිමේ ප්‍රගතිය විශේෂ කමිටුවක් මඟින් දැඩි සුපරික්ෂණයට භාජනය කරන ලදී. එසේම, සියලුම අක්‍රීය ණය අයකර අවසන් කිරීමටත් තවදුරටත් අයකර ගත නොහැකි ණය තිබේ නම් ඒ පිළිබඳව අවශ්‍ය නීතිමය පියවර ගැනීමටත් කටයුතු කරන ලදී. එම සැලසුමට අනුව විවිධ උපක්‍රම අනුගමනය කරමින්, අක්‍රීයව පැවති ණය අය කර ගැනීමේ ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුලින් අක්‍රිය වී තිබූ ණය ගිණුම් වලින් 2011 -2014 කාළ පරිච්චේදය තුල රුපියල් මිලියන 14.0 ක් අය කර ගැනීමට හැකිවිය.

තව දුරටත් ආයතනයේ පැවති කල් පසු වූ ක්‍රියාකාරී නොවන ණය ගිණුම් 1,553 පිළිබඳව කටයුතු කිරීමට පත් කරන ලද විශේෂ නිලධාරී කමිටුව විසින් මෙම ගිණුම් වෙන් වෙන් වශයෙන් පරීක්ෂාවකට භාජනය කිරීමේදී එක් ප්‍රතිලාභියෙක් සඳහා ලබා දුන් ණය මුදල් වටිනාකම, දිනය, පුද්ගල හා සේවා දත්ත, ආපසු අයකර ගත් ණය වටිනාකම, අක්‍රීය වූ දිනය, එදිනට ශේෂය, වත්මන් ශේෂය, ණය අයකර ගැනීම් සඳහා දරණ ලද උත්සාහයන් (යවන ලද ලිපි සංඛ්‍යාව, ලැබී ඇති ප්‍රතිචාර) සහ ණයකරුවන්ගේ වත්මන් තත්වය (වයස, සේවයේ සිටීම, නොසිටීම, ජීවත්ව සිටීම, මිය යෑම, වයෝවෘධ භාවය) වැනි සියළුම දත්ත පුළුල් විමර්ශණයකට භාජනය කර සාරාංශ ගත ලේඛණයක් 813 වන භාරකාර මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලදී. මෙදින වන විට ඉහත මූලික ණය මුදල රුපියල් මිලියන 12.46 ක් සහ උපචිත පොලිය රුපියල් මිලියන 58.2 ක් බවට පත්ව මුළු මුදල රුපියල් මිලියන 70.62 ක් දක්වා වැඩි වී තිබුණි.

එහිදී පැහැදිලි වූ කරුණු අනුව, මෙම ණය අයකර ගැනීම සඳහා ගත හැකි සියළුම ක්‍රියා මාර්ග ගෙන ඇති බව සහ තවදුරටත් ඒ වෙනුවෙන් නීති මගින් ක්‍රියා කිරීමේ කාලසීමාව පසුකර ඇති බව දන්වන ලදී. ඒ අනුව, බැවින් ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි පරිදි වලට අනුව මෙම ණය ආයතනයේ කළමනාකරණ හා විගණන කමිටුවේ නිර්දේශය සහිතව පොත් වලින් ලියා හැරීම පිළිබඳව සළකා බැලීමට භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. එසේම, වගුව 06 හි දැක්වෙන පරිදි මූලික මුදල වන රුපියල් මිලියන 12.46 ට සාපේක්ෂව ආයතනයට ආපසු අයවීම් ලෙස ලැබුණු රුපියල් මිලියන 14.64 තුල 17.5% ක අතිරික්තයක් පෙන්නුම් කරන අතර එයින් පොලී ආදායම (11.5%) ආවරණය වී ඇති බවද පැහැදිලි වී ඇත.

ඒ අනුව අදියර 4 ක් යටතේ අයකරගත නොහැකි ගිණුම් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලදී. 1984 වසරේ සිට 2005 වසර දක්වා කාලය තුල ණය මුදල් ලබා ගෙන තව දුරටත් ක්‍රියාකාරී නොවන ණය තත්වයට පත්වූ ගිණුම් 504 ක් විගණනය කරන ලදී. මෙම සියළුම ක්‍රියාකාරී නොවන ණය සඳහා හේතු වී ඇත්තේ කාලයක් තිස්සේ වාරික කඩින් කඩ අයවීමයි.

ඒ අනුව, 1984 -2005 වසර දක්වා කාල පරිච්ඡේදය තුල තිබූ ගිණුම් 504 පිලිබඳව පහත කරුණු අනාවරණය විය.

I. ලබා දී තිබූ මුළු ණය මුදල් වටිනාකම - රු: 3,877,200.00

අයකර ගන්නා ලද මුදල් ප්‍රමාණය (පොලිය ද සමග) - රු: 6,414,770.38

මූලික ණය මුදලට සාපේක්ෂව අයවී ඇති මුදල - රු: 2,537,570.38

අක්‍රිය වූ දිනට ශේෂය (මූලික ණය මුදලේ) - රු: 1,546,085.27

2013.12.31 දිනට හිඟව පැවැති ශේෂය (පොලිය ද සමග) - රු:16,226,259.43

මෙම මුදලින් රු: 6,414,770.38 ක් කඩින් කඩ වාරික වශයෙන් අයවී තිබීම හේතුවෙන් එම ගිණුම් තව දුරටත් පවත්වා ගෙන යැමට සිදුවී ඇත. ඒ අනුව මෙම කමිටුව විසින් එම ගිණුම් පියවා දැමීමට ඇති හැකියාව සොයා බලන ලදී. එහිදී තව දුරටත් අයවිය යුතු බවට පෙන්නුම් කරන රු: 16,226,259.43 ක මුදල මූලික මුදලට සාපේක්ෂව 50% ක අතිරික්තයක් ලද බව සැලකිල්ලට ගෙන 2013.12.27 දින පැවැති 817 වන භාරකාර මණ්ඩල තීරණය පරිදි අවසාන ගිණුම් වලින් ඉවත් කිරීමට තීරණය කරන ලදී. මෙම ඉවත් කිරීම තුලින් වාර්ෂික ශුද්ධ ලාභයට අහිතකර බලපෑමක් සිදුවී නොමැත. (වගුව- 6 )

II. මේ ආකාරයට අක්‍රිය ගිණුම් 36 ක් තුල තිබූ අක්‍රිය ණය මුදල් ආපසු අයකර ගැනීමට ගත හැකි උපරිම ක්‍රියා මාර්ග ගෙන තව දුරටත් අයකර ගැනීමට නොහැකි වූ ශේෂය බොල්ණය ලෙස ලියා හැරීමට තීරණය කරන ලදී. එහිදී ගිණුම් 36 හි අයකර ගැනීමට හැකි වූ මුදල හැර ඉතිරි ප්‍රමාණය බොල්ණය ලෙස ලියා හැරීමට ක්‍රියා කරන ලදී. එහි සාරාංශය පහත පරිදි වන අතර, බොල්ණය වලින් කපා හල ආකාරය වගුව 6 හි දක්වා ඇත.

ගිණුම් 36 ක තිබූ ණය මුදල් වල වටිනාකම - රු: 209,500.00

එයින් ආපසු අයකර ගන්නා ලද ණය වටිනාකම - රු: 436,489.36

(පොලිය සමග ගිණුම් 36 ක මුළු මුදල)

එම ගිණුම් වල අක්‍රිය වූ දිනට ශේෂය(මූලික මුදල) - රු: 176,160.73

බොල්ණය ලෙස ලියා හරින විට ශේෂය(පොලිය සමග) - රු: 2,090,040.80

(පොලිය ද සමග)

III. ඉහත ක්‍රියාවලිය තවදුරටත් අනුගමනය කිරීම හේතුවෙන් එම වකවානුව තුලම ක්‍රියාකාරී නොවන තවත් ණය ගිණුම් 860 ක් සොයාගැනීමටහැකි වී ඇත. එම ගිණුම් සම්බන්ධයෙන් ද 818 වන භාරකාර මණ්ඩලයේ තීරණය පහත පරිදි වේ. (වගුව 6)

ගිණුම් 860 හි මුළු ණය වටිනාකම - රු: 6,598,200.00

ආපසු අයකර ගත් ණය වටිනාකම (පොලිය සමග) - රු: 5,763,308.17

අයකර ගත නොහැකි වූ වටිනාකම (මූලික මුදල) - රු: 834,891.83

එම ගිණුම් අක්‍රිය වූ දිනට ශේෂය (පොලිය සමග) - රු: 3,488,583.85

2014.07.30 දිනට පොලිය සමග ශේෂය - රු:47,030,670.81

IV. අක්‍රීය ගිණුම් 153 ක් ද නිසි විගණනයකින් පසුව 820 දරණ භාරකාර මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉහත ආකාරයටම කටයුතු කරමින් පහත පරිදි පොත් වලින් ඉවත් කරන ලදී. (වගුව 6)

| | |
|---|---|
| ලබා දුන් ණය මුදලේ ප්‍රාග්ධන වටිනාකම | - රු: 1,775,542.15 |
| අයකර ගෙන ඇති වාරික වටිනාකම | - රු: 2,029,262.55 |
| ණය මුදලට සාපේක්ෂව ලැබූ ආදායම | - රු: 253,720.40 |
| අක්‍රීය වූ දිනට ශේෂය | - රු: 1,002,752.66 |
| 2014.12.31 දිනට පොලිය ද සමග ශේෂය | - රු: 5,273,333.33 |

මෙම මුදල් ද බොල්ණය වෙන්කිරීම් තුලින් ගලපා අවසාන ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කල ආකාරය 7 වගුවෙහි දක්වා ඇත.

**වගුව - 06 - 1984 – 2005 දක්වා අක්‍රීය ණය ගිණුම් සාරාංශය**

| අක්‍රීය ගිණුම් අදාල වන කාල පරිච්චේදය | ගිණුම් සංඛ්‍යාව | ණය මුදලේ ප්‍රාග්ධන වටිනාකම රු. | ආපසු අයකර ගත් මුදල රු. | ඌණතාවය/ අතිරික්තය රු. | අක්‍රීය වූ දිනට ශේෂය රු. | උපචිත පොලිය ද සමග ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| 1984-2005 | 504 | 3,877,200 | 6,414,770 | 2,537,570 | 1,546,085 | 16,226,259 |
| 1984-2008 | 36 | 209,500 | 436,489 | 226,989 | 176,161 | 2,090,041 |
| 1984-2008 | 860 | 6,598,200 | 5,763,308 | (834,891) | 3,488,584 | 47,030,671 |
| 1984-2005 | 153 | 1,775,542 | 2,029,263 | 253,720 | 1,002,752 | 5,273,333 |
| එකතුව | 1553 | 12,460,442 | 14,643,830 | 2,183,388 | 6,213,582 | 70,620,304 |

සටහන : -2013.03.06 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවේ නිරීක්ෂණයට භාජනය වන විට පැවති අක්‍රීය ණය වටිනාකම රුපියල් මිලියන 59.2 ක් වූ අතර අදාල නිර්දේශ ක්‍රියාත්මක කරන අවස්ථාව වන විට ගත වූ කාලය තුල එකතු වූ පොලිය මත එය රුපියල් මිලියන 70.6 ක් වී ඇත.

**වගුව - 07 - අක්‍රීය ණය ගිණුම් 1,553, ගිණුම් වලින් ඉවත්කළ ආකාරය**

| කාල පරිච්ඡේදය | ගිණුම් සංඛ්‍යාව | අක්‍රීය ගිණුම් වල ශේෂය | | | ගිණුම් වලින් ඉවත් කල ආකාරය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අක්‍රීය වූ දිනට ශේෂය රු. | උපචිත පොලිය රු. | පොලිය ද සමග ශේෂය රු. | අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුමෙන් රු. | අවිනිශ්චිත පොලී ගිණුමෙන් රු. | එකතුව රු |
| 1984-2005 | 504 | 1,546,085 | 14,680,174 | 16,226,259 | 1,546,085 | 14,680,174 | 16,226,259 |
| 1984-2005 | 36 | 176,161 | 1,913,880 | 2,090,041 | 176,161 | 1,913,880 | 2,090,041 |
| 1984-2008 | 860 | 3,488,584 | 43,542,086 | 47,030,671 | 3,488,584 | 43,542,086 | 47,030,671 |
| 1984-2005 | 153 | 1,002,752 | 4,270,580 | 5,273,332 | 1,002,752 | 4,270,580 | 5,273,333 |
| එකතුව | 1553 | 6,213,582 | 64,406,722 | 70,620,304 | 6,213,582 | 64,406,722 | 70,620,304 |

එසේම, තව දුරටත් 2010 ට පසු අක්‍රීය ණය ලෙස 2014.12.31 දිනට පවතින රුපියල් මිලියන 1,565,623.98 ක මුදල සඳහා නිසි ක්‍රියා මාර්ග ගන්නා අතර මින් ඉදිරියට ක්‍රියාකාරී නොවන ණය බිහිවීම වැලැක්වීම සඳහා ආයතනය තුල විධිමත් වැඩ පිලිවෙලක් ආරම්භ කරන ලදී.

## 1.6 ආයතනයට අතිරික්ත මුදල් අයවීම්

ණය ගිණුම් පියවා අවසන් වීමෙන් පසුව ද විවිධ හේතුන් මත අදාල ආයතන විසින් මුදල් අයකර එවීම මත වර්ෂ ගණනාවක් තිස්සේ එකතු වී ඇති මුදල් මෙම ආයතනය තුල **"අතිරික්ත අයවීම් "** ලෙස රුපියල් මිලියන 12.7 ක් 2012.12.31 දිනට වූ අවසාන ගිණුම් වල පෙන්නුම් කරන ලදී. එම අතිරික්ත අයවීම් ද පොදු ව්‍යාපාර කාරක සභාවේ උපදෙස් පරිදි, ණයකරුවන් වෙත දැනුම්දීමෙන් පසුව ද තවදුරටත් අයිතිකරුවන් ඉදිරිපත් නොවුන මුදල් අරමුදලේ ආදායම් ගිණුමට පවරා ගැනීමට ක්‍රියා කරන ලදි. ඒ අනුව, 2014.12.31 දින වන විට එය රු 784,107.33 ක් දක්වා අඩුකර ගැනීමට හැකි විය.

## 1.7. කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

### 1.7.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සදහන් ආයතන වලට කුලියට දි 2014 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 14.3 ක් උපයා ගන්නා ලදී.

**වගුව 08 – 2014 වසරේ ගොඩනැගිලි කුලී ආදායම**

| අනු අංක | ආයතනය | කුලියට සිටින මහල | වර්ග අඩි ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| 01 | ලෝහෝර් ආර්යා ණය අරමුදල | 3 වන මහල | 5,500 | - |
| 02 | ලේක්හවුස් පොත්හල | බිම් මහල හා පතුල් මහල | 10,790 | 5,074,500 |
| 03 | සමූපකාර සේවක කොමිෂන් සභාව | 1 වන මහල | 2,415 | 1,833,600 |
| 04 | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 1 වන මහල | 2,750 | 2,213,600 |
| 05 | ලංකා විදුලිබල මණ්ඩලය | 2 වන මහල | 4,700 | 3,860,472 |
| 06 | රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම | 2 වන මහල | 840 | 960,000 |
| 07 | ඒ.ජේ.එස්. ඇසෝසියේටඩ් ආයතනය | අංක : 100/20 | 380 | 408,000 |
| | **එකතුව** | | **27,375** | **14,350,172** |

### 1.7.2 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මුල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් මෙහි පොලී ආදායම තුලින් දරනු ලැබේ.පොලී ආදායම තුල මෙහෙයුම් චිරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනිම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව අරමුදලේ අතිරික්ත මුදල් මහජන බැංකුවේ පහත අයුරින් ආයෝජනය කර ඇත.

**වගුව 09 - ආයෝජන**

| ආයෝජන වර්ගය | බැංකුව | 2014/12/31 දිනට (රු.) | 2013/12/31 දිනට (රු.) |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුව | 85,429,103 | 71,842,646 |
| භාණ්ඩාගාර බිල්පත් | ,, | 13,317,348 | 12,416,639 |
| කෙටිකාලීන ආයෝජන (REPO) | ,, | 38,507,836 | 15,360,453 |
| එකතුව | | **137,254,287** | **99,619,738** |

### 1.7.3 මෙහෙයුම් ආදායම

2014 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 80.37 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 34.04 කි. 2013 වසරේ මෙහෙයුම් ආදායම වූ රුපියල් මිලියන 76.33 ට සාපේක්ෂව රුපියල් මිලියන 4 ක වර්ධනයකි.

**ප්‍රස්තාර 02 - මෙහෙයුම් අතිරික්තය 2011 - 2014**




## 1.8 ණය ලබා දීමේ පහසුකාරකයෙකු (Facilitator) වූ ආයතන.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ පොල් සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා එම ආයතනයේ මුදල් භාවිතා කරමින් ණය ලබා දීමේ පහසුකම් සලසන්නෙකු ලෙස 2014 වසර දක්වා කටයුතු කල අතර එම ණය ක්‍රියාවලිය තුලින් විශේෂ ප්‍රගතියක් පෙන්නුම් නොකල හෙයින් 2014 ජූනි මස 30 වන දිනට තැන්පතු මුදලේ ශේෂය සඳහා රු.82,626.59 ක් වටිනා චෙක්පතක් පොල් සංවර්ධන අධිකාරියේ පාලන අධිකාරිය වෙත ලබා දී එම ණය ක්‍රියාවලිය නතර කරන ලදි.

**පොල් සංවර්ධන අධිකාරිය තැන්පතු මුදල් හා ණය ගිණුම් පියවීම 2014.06.30 දිනට.**

| | |
|---|---|
| තැන්පතු ගිණුමේ ශේෂය | රු. 1,665,466.36 |
| අඩු කළා - ණය ගිණුම් ශේෂය | රු. (1,582,839.77) |
| පොල් සංවර්ධන අධිකාරිය වෙත ලබා දුන් චෙක්පතේ වටිනාකම | **රු. 82,626.59** |

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට 2014 වසරේ පහත සඳහන් පරිදි ණය සපයා ඇත.**

| ආයතනය | ණය සංඛ්‍යාව | ලබා දුන් ණය වටිනාකම (රු.) |
|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 07 | 70,000 |

## 1.9 දැයට කිරුළ වැඩ සටහන - 2014

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව යමින් රටේ සංවර්ධන වැඩපිලිවෙලට මෙම අරමුදලද දායකත්වය ලබාදෙන ලදී. ඒ අනුව ජාතික සංවර්ධන වැඩපිලිවෙල සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කරන වාර්ෂික දැයට කිරුළ ප්‍රදර්ශණ වැඩසටහනට සමගාමීව මෙම අරමුදලේ ප්‍රතිලාභ සියලුම දිස්ත්‍රික්කවල රාජ්‍ය සේවකයින් සඳහා ලබා දීමේ අරමුණින් කුරුනෑගල , කෑගල්ල , පුත්තලම යන දිස්ත්‍රික්කවල රාජ්‍ය සේවයේ නියුතු සේවකයන් 148 ක් සඳහා රු. මිලියන 5.88 ක ණය මුදලක් ප්‍රදානය කිරීමට ක්‍රියා කරන ලදී.

වගුව **10 -** දැයට කිරුළ පවත්වන ලද දිස්ත්‍රික්ක වල ණය ප්‍රතිලාභීන් සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | සේවක සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම (රු. 000) |
|---|---|---|
| කුරුණෑගල | 51 | 2,000 |
| කෑගල්ල | 94 | 3,760 |
| පුත්තලම | 03 | 120 |
| **එකතුව** | **148** | **5.880** |

# 2. අරමුදලේ පසුබිම

මෙරට කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පූණ්‍ය කොමසාරිස්ව සිටි නැතනියල් දේවගැතිතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදි.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ ඒවා ආපසු අයකර ගනිමින් චක්‍රීය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදුවී සිටියහ. මේ හේතුව නිසා රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනිමේදී ඉමහත් සහනයක් සැලසුනි.

1957 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගී කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.

## 2.1 භාරකාර මණ්ඩලය

භාරකාර මණ්ඩලය රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසකධුරය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් හොබවන අතර, භාරකාර මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්කිරීම ඔහු හෝ ඇය විසින් සිදුකරනු ලැබේ. අරමුදලෙහි පරිපාලනය සඳහා අවශ්‍ය වන භාරකාර මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා පාලන භාරකරුවකු 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වු අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 3.2 වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

## 2.2 වගුව 11 – 2014 වසරේ ආයතනයේ කාර්යය මණ්ඩලය

| අනු අංකය | අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ගණකාධිකාරී | 01 | 01 |
| 2 | පරිපාලන නිලධාරි | 01 | 01 |
| 3 | ගිණුම් නිලධාරි | 01 | 01 |
| 4 | අභ්‍යන්තර විගණන නිලධාරි | 01 | 01 |
| 5 | කළමනාකරණ සහකාර | 35 | 32 |
| 6 | රියදුරු | 02 | 02 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 05 | 05 |
| 8 | ගොඩනැගිලි නඩත්තු සහායක | 01 | 01 |
| | එකතුව | 47 | 44 |

## 2.3 සංවිධාන ව්‍යුහය


සභාපති ඇතුළු
භාරකාර මණ්ඩලය
පාලන භාරකාර
ගණකාධිකාරී
01
ගිණුම් නිලධාරී
01
පරිපාලන නිලධාරී
01
විගණක නිලධාරී
01
කළමණාකරණ
සහකාර
22
කළමණාකරන
සහකාර 12
කළමණාකරන
සහකාර
01
රියදුරු
02
ගොඩනැගිලි
නඩත්තු සහායක
01
කාර්යාල කාර්ය
සහායක
02
කාර්යාල කාර්ය
සහායක
03

# 3. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

### 3.1 නව බඳවා ගැනීම්/සේවයෙන් ඉවත්වීම.

2014 වර්ෂය තුලදී කළමනාකාර සහකාර සේවයේ නිලධාරින් 4 දෙනකු එම නිලධාරින්ගේ පෞද්ගලික අවශ්‍යතා මත සේවයෙන් ඉවත් වූ අතර පුරප්පාඩුව වූ තනතුරු සඳහා කළමණාකරණ සහකාර 111 ශ්‍රේණියට නව නිළධාරීන් 03 දෙනකු බඳවා ගන්නා ලදී.

### 3.2 කාර්ය මණ්ඩල ණය

- නිලධාරීන්ගේ මාස 10 ක වැටුප හා පදනම්ව උපරිමය රු.250,000/- සීමාවට යටත්ව කාර්ය මණ්ඩල සේවකයින්ට ණය ලබා දීමට කටයුතු කරන ලදී.
- රු. 10,000/- බැගින් වූ උත්සව අත්තිකාරම් සියලුම සේවකයින්ට ලබා දිමට කටයුතු කරන ලදී.
- රු. 6000/- බැගින් වූ පාපැදි ණය සේවක ඉල්ලීම මත සේවකයන් 8 දෙනෙකුට ලබා දීමට කටයුතු කරන ලදී.
- රු. 15,000/- බැගින් වූ ප්‍රසාද දීමනා කළමනාකරණ චකුලේඛ අංක 5/2014 ට අනුව සියලුම සේවකයින්ට ලබා දිමට කටයුතු කරන ලදී.

### 3.3 පාවිච්චි කල නොහැකි අබලි භාණ්ඩ අපහරණය

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පාවිච්චි කල නොහැකිව භාවිතයෙන් ඉවත් කර ඇති අබලි ද්‍රව්‍ය (පුටු, මේස, කබඩ්, පරිගණක, විදුලි පංකා ආදිය) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් විධිමත් කමිටුවක් මගින් මිල ගණන් තක්සේරු කොට රු.29,000/- කට වෙන්දේසි කරන ලදී.

තවදුරටත් කාර්යාලයේ ඉතිරි වූ අබලි ද්‍රවය ලේඛනගත කර ගංගාරාම විහාර්ථානය වෙත ලබා දිමට කටයුතු කරන ලදි.

### 3.4 ලේඛනාගාරය ලිපිගොනු අපහරණය

1983 - 2010 වර්ෂ වලට අදාලව තවදුරටත් ලේඛනාගාරයේ ඉතිරිව තිබූ ලිපිගොනු 10366 ක් (කඩදාසි - 3671 Kg) රු. 14,684/- කට වාලච්චේන කඩදාසි සංස්ථාව වෙත යැවීමට පියවර ගන්නා ලදී.

### 3.5 ගොඩනැගිලි පරිශ්‍රය වැඩි දියුණු කිරීම හා කාර්යාල නවීකරණය

ලෝහෝර් ආර්යා ණය අරමුදලට අයත් ගොඩනැගිල්ල කාලානුරූපීව නවීකරණය කිරීමට කටයුතු යොදා ඇත. කාර්යාල නවිකරණය යටතේ නව මේස සහ පුටු මිලදි ගැනිම සඳහා වර්ෂය තුළදි රු. 489,807 ක මුදලක් වැය කරන ලදි.

### 3.6 විගණන හා කළමණාකරණ කමිටුව

